ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல.
**Pelawatta, Battaramulla.**

මගේ අංකය / எமது இல / My No. : 1/1/ මාධ්‍ය නිවේදන 2022
ඔබේ අංකය / உமது இல / Your No. : ......................
දිනය / திகதி / Date : 2022.01.15

දුරකථන අංක / தொலைபேசி / Telephone : 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address : www.doenets.lk, www.results.exams.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax : 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS : තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo
e-mail: exams@doenets.lk

සියලු ම මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

පහත සඳහන් නිවේදනය ඔබ විද්‍යුත් / මුද්‍රිත මාධ්‍යයෙහි ප්‍රචාරය කිරීමට / පළ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කර සලකමි.

එල්. එම්. ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

## මාධ්‍ය නිවේදනය

### උපකාරක පන්ති පැවැත්වීම තහනම් කිරීම
### 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2021(2022) සහ
### අ.පො.ස. (උසස් පෙළ) විභාගය - 2021 (2022)

2021 වර්ෂයට අදාළව පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2022 ජනවාරි මස 22 දින සහ අ.පො.ස.(උසස් පෙළ) -2021 (2022) විභාගය 2022 පෙබරවාරි මස 07 දින සිට මාර්තු මස 05 වන දින දක්වා ද පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

2. 2015.08.12 දිනැති අංක 1927/49 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතෙහි 22 වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට අදාළව,

   - 2022.01.18 දින මධ්‍යම රාත්‍රී 12.00 සිට සම්පූර්ණ විභාගය අවසන් වන තෙක් සහ ,

3. 2013.06.21 දිනැති ගැසට් නිවේදනය මගින් සංශෝධිත 1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතෙහි 22 වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව අ.පො.ස.(උසස් පෙළ) විභාගයට අදාළව,

   - 2022.02.01 දින මධ්‍යම රාත්‍රී 12.00 සිට සම්පූර්ණ විභාග අවසන් වන තෙක්,

**පහත කාර්යයන් සිදු කිරීම සපුරා තහනම් බව නිවේදනය කරමි.**

I. විභාග අපේක්ෂකයින් සඳහා උපකාරක පන්ති සංවිධානය කිරීම සහ එම පන්ති මෙහෙයවීම.

II. විෂයානුබද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

III. උක්ත විභාගය සඳහා අනුමාන ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සහ ඒවා බෙදා හැරීම.

IV. විභාග ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ලබා දෙන බවට හෝ ඒ හා සමාන ප්‍රශ්න ලබා දෙන බවට පෝස්ටර්, බැනර්,අත්පත්‍රිකා විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කිරීම හෝ එවැනි දෑ ළඟ තබා ගැනීම

4. යම් අයෙක් හෝ ආයතනයක් හෝ වෙනත් පාර්ශවයක් මෙකී නියෝග නොසලකා ක්‍රියා කරනු ලැබුවහොත් ඒ තැනැත්තා හෝ ආයතනය හෝ එම පාර්ශවය මෙම පනත යටතේ වරදකරුවෙකු වේ.

5. කිසියම් තැනැත්තෙකු හෝ ආයතනයක් හෝ පාර්ශවයක් මෙම නියෝග යම් ආකාරයකින් කඩ කිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් හෝ සිදු කළහොත් ඒ පිළිබඳව ළඟ ම පවතින පොලිස් ස්ථානය හෝ පොලිස් මූලස්ථානය හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පහත දුරකථන අංක ඔස්සේ පැමිණිලි කළ හැක.

| | |
|---|---|
| **පොලිස් මූලස්ථානය** | **: 0112421111** |
| **පොලිස් හදිසි ඇමතුම් අංකය** | **: 119** |
| **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය** | **: 1911** |
| **විභාග කොමසාරිස් ජනරාල් කාර්යාලය** | **: 0112785211 / 0112785212** |
| **පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව** | **: 0112784208 / 0112784537** |

එල්. එම්. ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්